නිපුණතා මට්ටම 8.1

# පේපර් ක්විලින් කලාව

කඩදාසි ඇසුරින් විවිධ නිර්මාණවල යෙදීම අතීතයේ සිට පැවති බව අපි දනිමු. ඒවා අතර කැටයම් කලාව, මල් සැකසුම් හා විවිධ පල්ප නිර්මාණ ආදිය ඇතුලත්වේ.

වර්ථමානයේ ඉතා ජනප්‍රිය කඩදාසි කලාවක් ලෙස **"පේපර් ක්විලින්"** කලාව හඳුන්වා දිය හැකිය. විවිධ ප්‍රමාණයන්ගෙන් කපා ගන්නා කඩදාසි තීරු රෝල් කිරීමට ලක්කර විවිධ හැඩතලයන්ට හැඩ ගන්වා වෙනත් මතුපිටක අලවා ගැනීම තුළින් මෙම නිර්මාණයන් ගොඩ නගනු ලැබේ.

පේපර් ක්විලින් සඳහා කඩදාසි පටි කපා ගැනීමට වෙළඳපොළෙන් මිලදී ගත හැකි කුඩා යන්ත්‍රයක් ඇත. එය සාමාන්‍ය මිල රු.750.00 ක් පමණ මුදලකට මිලදී ගැනීමට හැකියාව ලැබේ.

පහත දැක්වෙන්නේ එම කුඩා යන්ත්‍රයයි.




අන්තර්ගතය - S.M.S පුෂ්පකුමාරි - ගුරු උපදේශක
සැකසුම - H.නිලානි නිසංසලා - ර/කොළඹගම මහානාම ම. වි

මෙම යන්ත්‍රයට ඔබ භාවිතා කරන A4 පිටපත් ඇතුළත් කර අවශ්‍ය ප්‍රමාණයට තීරු පටි කපාගත යුතුය.









මෙසේ කපාගත් තීරු පටි රෝල් කර ගැනීම සඳහා ද කුඩා උපකරණයක් වෙළඳපොළෙන් මිලදී ගත හැකිය.





අන්තර්ගතය - S.M.S පුෂ්පකුමාරි - ගුරු උපදේශක
සැකසුම - H.නිලානි නිසංසලා - ර/කොළඹගම මහානාම ම. වි

පන්ති කාමරයේ මේ සඳහා විකල්ප උපකරණයක් ඔබට සකස් කර ගත හැකිය. උදාහරණ පෑන් බටයක්,ටූත් පික් එකක්, ආදී ලෙස...

කපාගත් කඩදාසි තීරු රෝල් කරගෙන ලිහිල් කරගත යුතු නම් ඒ සඳහා ද කුඩා තැටියක් ආකාරයේ උපකරණයක් භාවිතා කරයි. නොඑසේ නම් අතින් ප්‍රමාණය සකසා හැඩ ගැන්වීම කල හැකිය.





අන්තර්ගතය - S.M.S පුෂ්පකුමාරි - ගුරු උපදේශක
සැකසුම - H.නිලානි නිසංසලා - ර/කොළඹගම මහානාම ම. වි

කපා හැඩකර රෝල් කර ගත් පටිය කොන ගම් ආලේප කර අලවා ගැනීම තුළින් ගැලවී යාම වලක්වාලයි. හැඩගැන්වීම සඳහා "ටෙම්ප්ලේට් / ''ව්විසරයක්'' භාවිත කල හැකි අතර අතින් හැඩගන්වා ගැනීම ද සිදු කල හැකි ය.





අන්තර්ගතය - S.M.S පුෂ්පකුමාරි - ගුරු උපදේශක
සැකසුම - H.නිලානි නිසංසලා - ර/කොළඹගම මහානාම ම. වි

සකස් කරගත් හැඩතල අවශ්‍ය මෝස්තරය ගොඩනගා අලවා ගැනීම සිදු කල යුතුය.





අන්තර්ගතය - S.M.S පුෂ්පකුමාරි - ගුරු උපදේශක
සැකසුම - H.නිලානි නිසංසලා - ර/කොළඹගම මහානාම ම. වි

පසුබිම සඳහා ඝන කඩදාසි, සංයුක්ත තැටි ආදිය භාවිතා කල හැකිය.







අන්තර්ගතය - S.M.S පුෂ්පකුමාරි - ගුරු උපදේශක
සැකසුම - H.නිලානි නිසංසලා - ර/කොළඹගම මහානාම ම. වි

මෙම පේපර් ක්විලින් නිර්මාණ යොදා ආරාධනා පත්‍ර සැකසීම, උපන්දින සැමරුම් කාඩ් සැකසීම මෙන්ම බිත්ති සැරසිල් ආදී නිර්මාණාත්මක ක්‍රියාවන් හි නියැලීම තුළින් රැකියා සඳහා යොමු වීමේ හැකියාව ද ඇත.

මෙම නිර්මාණයන් සිදු කිරීමේදී වියලි ශාක පත්‍ර, වර්ණ නූල්, වර්ණ, බොත්තම් ආදී උපාංගද එක් කිරීමෙන් නිර්මාණයේ කලාත්මක අගය වැඩිදියුණු කල හැකිය.

මෙලෙස සැකසූ පේපර් ක්විලින් මෝස්තර ඇතුළත් නිර්මාණ කිහිපයක් අධ්‍යාපනය තුළින් ඔබට ද විවිධ නිර්මාණයන් හි නියැලීමට හැකිවෙනු ඇත.

අන්තර්ගතය - S.M.S පුෂ්පකුමාරි - ගුරු උපදේශක
සැකසුම - H.නිලානි නිසංසලා - ර/කොළඹගම මහානාම ම. වි